4 වන පිටෙන්

වෙයි. ආගම වැනි විශ්වාස පද්ධතියක්, පුද්ගලයෙකුගේ නිත්‍ය අනන්‍යතා සළකුණක් විය හැක්කේ කෙසේ ද?

උපතේ දී කෙරෙන මේ නාමකරණය නිසා එසේ නම් කරන ලද ආගමට කෙනෙකු ඉතා ප්‍රබල ආකාරයකින් බැඳෙයි. ආගම, රටක ඇති වඩාත් ප්‍රබල සමාජානුයුක්ත මෙවලම්වලින් එකකි. එම සමාජායනය මොන තරම් අප වසා පැතිරෙන්නේ ද යත්, අපේ මනෝභාවයන් එකී ආගමික කෝව තුළින් සැපයෙන ලෝකය හෝ යථාර්ථය සදාතනිකව වැළඳගන්නා තරමට ඒ සමග ගැටගැසෙයි. දරුවන් වශයෙන් අප වැඩෙන්නේ, උඩ අහසේ අප දෙස බලා සිටින ගැලවුම්කරුවෙකු අපේ සෑම චලනයක්ම නිරීක්ෂණය කරතැ යි යන විශ්වාසයත් සමගිනි. ඔහු නම් අතිශය කාර්යබහුල ගැලවුම්කරුවෙකු විය යුතුය. අපේ ඉරණම අල්ලා දෙවියන් වහන්සේ විසින් නියම කෙරෙති යි කියා විශ්වාස කිරීමට ද, අපට අනර්ථයක් සිදුවෙද්දී පවා අල්ලා දෙවියන්ට ආශීර්වාද වේවා යි ද යාච්ඤා කිරීමට ද අපට කියාදෙති.

ලෝකය පුරා වෙසෙන අනුගාමිකයන් ආගමේ නාමයෙන් දිවි දීමට, සටන් කිරීමට සහ ඝාතනය කිරීමට පේ වීම පුදුමයක් නොවේ. දෙමාපියන්, මිතුරන්, පවුල, පාසල, පල්ලිය ඇතුළු දේවගැතියන්, මුල්ලාවරුන් සහ ස්වාමිවරුන්ගේ මැදිහත් වීමෙන් ප්‍රබන්ධිත යථාර්ථයක් අනුගාමිකයාට සැපයෙන අතර, රැලෙන් පැන්නොත් ඇති විය හැකි බරපතල ප්‍රතිවිපාක ගැන නිරතුරුව අනතුරු අඟවනු ලැබේ. ආගම, ජගත් සමාජයේ ගැටුම් සහ යුද්ධ ඇති කරන වඩාත් භේදකාරී බලවේගවලින් එකක් වීම බෙහෙවින් උත්ප්‍රාසාත්මක ය. මෙය කියවන පාඨක ඔබ බෞද්ධයෙකු විය හැකිය. එහෙත් යම් හෙයකින් ඔබ ඇෆ්ගනිස්ථානයේ උපන්නේ නම් කතාව වෙනස් එකක් වනු ඇත. එහි දී තලිබාන්වරුන් සමග එකතු වී ඔබ ඒ ශ්‍රේෂ්ඨ බාමියන් බුද්ධ ප්‍රතිමා විනාශ කරන්නට ද තිබුණි.

මේ සමස්තය එකම විකාරයකි■ ඔබ සටන් කරන්නේ, අතදරුවෙකු වශයෙන් ඔබ මත පටවන ලද අනන්‍යතාවක් වෙනුවෙනි. මුල්ලාවරුන් සහ භික්ෂූන් විසින් සහමුලින් නිර්මාණය කර දෙන ලද යථාර්ථයක් වෙනුවෙනි. ඔබ මැරෙන්නේත්, සෙස්සන්ව මරන්නේත් ඒ වෙනුවෙනි. එය පිස්සුවක් නොවෙයි ද?

ආගම් අදහන සියලු අනුගාමිකයන් අන්ධ සහ නියාලු පුද්ගලයන් යැයි මම නොකියමි. බොහෝ දෙනාගේ තර්ක බුද්ධිය තියුණු ය. එහෙත්, උපතින් ලැබුණු ආගම, සමාජමය පහසුව හෝ සිතේ සාමය හෝ හුදෙක් පුරුද්දක් නිසා හෝ අතනාරිති. අවසානයේ කී පිරිස ස්වකීය ආගමේ ඇතැම් දේවල් පිළිගන්නා අතර තවත් දේවල් බැහැර කරති.

මේ අතර, ආගම වෙළඳාමක් කරගන්නා වංචනිකයෝ ද සිටිති. බලය සඳහා හෝ ලාභය සඳහා එවැන්නෝ ආගම පාවිච්චි කරති. ජනතාව ගොදුරු කරගන්නා ආගමික භක්ෂයෝ ඔවුහු ය.

මෙකී ප්‍රතිවිරෝධතා කෙතෙක් තිබියේ වී නමුත් ආගමේ වසගය කිසි දා වියැකෙන එකක් නැත. ආගම් අපේ පොකැට්ටුවට විදින ප්‍රමාණය ද සුළුපටු නැත. ඒ වටා සමස්ත කර්මාන්තයක්ම බිහි වී ඇති අතර අනුගාමිකයන් අනේකවිධ දානමාන දිය යුතුය. රිදෙන තෙක් දෙන්නැ යි කී ඇමරිකානු ශුභාරංචිකරුවකු ගැන ප්‍රසිද්ධ කතාවක් ද තිබේ. ළඟදී මා ගිය තායිවාන පන්සලක, මළගිය ප්‍රාණකාරයන්ට පින්දීම ඩොලර් දහයක මුදලකට සපයන ලදි. එසේ කිරීමත් මොන තරම් දයාවන්ත ක්‍රියාවක් ද?

පරිවර්තනය - යහපාලනය ලංකා




